# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
ආරක්ෂක ලේකම්.
මුදල් ලේකම්.
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන
කො.ස. සභාපති
විගණකාධිපති.

මගේ අංකය: අමප/15/1528/713/010
2015 දෙසැම්බර් මස 03 දින.

ක්‍රියා කළ යුතු : උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්.

**විශ්වවිද්‍යාලවල හා ඒ යටතේ ඇති උසස් අධ්‍යාපන**
**ආයතනවල ආරක්ෂක කටයුතු ප්‍රතිසංවිධානය කිරීම**

(උසස් අධ්‍යාපන හා මහාමාර්ග ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2015-10-16 දිනැති සංදේශය)

2015 නොවැම්බර් මස 18 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:**

**(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:**

11. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 15/1528/713/010 වූ, "**විශ්වවිද්‍යාලවල හා ඒ යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනවල ආරක්ෂක කටයුතු ප්‍රතිසංවිධානය කිරීම**" යන මැයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිතුමා ඉදිරිපත් කළ 2015-10-16 දිනැති සංදේශය - (අමප අංක 11/1772/521/037 පිළිබඳව වූ 2011-09-14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සංදේශය මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

→ 2

(I) පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දීම:

(i) වත්මන් ආරක්ෂක කොන්ත්‍රාත් ගිවිසුම්වල කාලය අවසන් වීමෙන් අනතුරුව, ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කර එක් එක් ආයතනයේ අනාගත ආරක්ෂක කටයුතු සඳහා සුදුසු ආරක්ෂක සේවා ආයතනයක් තෝරා ගැනීම පිණිස, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ විෂයපථය යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල බලධාරීන්ට බලය පවරා දීම;

(ii) සංදේශයේ 3.1 ඡේදයේ (ආ) යෝජනාව සඳහා; සහ

(II) අමාත්‍යාංශයේ විෂයපථය යටතේ ඇති විශ්වවිද්‍යාලවල හා උසස් අධ්‍යාපන ආයතනවල ආරක්ෂක කටයුතු සඳහා එම ආයතනවල කාර්ය මණ්ඩලයට අළුතින් බඳවාගැනීමේ යෝජනාව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නොකරන ලෙස උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියම කිරීම.

ක්‍රියා කළ යුතු: **උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය** - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: **ජනාධිපති ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**අග්‍රාමාත්‍ය ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**ආරක්ෂක අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
**මුදල් අමාත්‍යාංශය**
**සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.